10 - 445

---

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ආරක්ෂක සේවයේ දුම්රිය ආරක්ෂක (පිරිමි/කාන්තා) - III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත ලිඛිත තරග විභාගය - 2026

උක්ත කරුණ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2504 හා 2026.08.28 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීමෙහි,

- 3.4 ඡේදය පහත පරිදි සංශෝධනය කරමි.

"රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 විධිවිධාන අනුව රාජ්‍ය සේවයට බැඳුණු භාෂා මාධ්‍යයට අමතරව අනෙක් රාජ්‍ය භාෂා පිළිබඳ ප්‍රවීණතාව ලබා ගත යුතු වේ."

- 05 (ඇ) ඡේදය පහත පරිදි සංශෝධනය කරමි.

**"2026.09.28 දිනට අවම වයස් සීමාව අවුරුදු 18 නොඅඩු විය යුතු අතර උපරිම වයස් සීමාව අවුරුදු 28 නොවැඩි විය යුතු ය. (ඒ අනුව 2008.09.28 දිනට හෝ ඊට පෙර හා 1998.09.28 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)"**

මේ අනුව අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය 2026.10.16 දින දක්වා දීර්ඝ කරනු ලැබේ.

මේ වන විටත් අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් නැවත අයදුම්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

තව ද, එම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙහි සඳහන් අනෙකුත් කරුණු නොවෙනස්ව පවතින බව ද, වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

**රවීන්ද්‍ර පත්මප්‍රිය,**
දුම්රිය සාමාන්‍යාධිකාරී.

2026 ඔක්තෝබර් මස 06 වැනි දින,
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය,
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 355,
ඕල්කට් මාවත,
කොළඹ 10.

10 - 521